# පුරප්පාඩු

## රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යංශය

පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් කාර්යශූර, ස්වයංගාමක, වෘත්තීය උන්නතිගාමී කණ්ඩායම් හැගීමෙන් කටයුතු කළ හැකි අයවලුන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමග අත්වැල් බැඳ ගැනීම අපි අපේක්ෂා කරමු.

**සෑම අයදුම්කරුවෙකුම,**

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) තනතුරේ වගකීම් නිසිලෙස ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි මනා ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(iii) මනා චරිතයකින් යුක්ත අයෙකු විය යුතුය.

### (1) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය තනතුර - (HM 1-1)

**රාජකාරි:**

මූල්‍ය අංශයේ ප්‍රධානී ලෙස මූල්‍ය කළමනාකරණ පාලනයට අදාළ සියලු කටයුතු සඳහා සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය ; එනම්,

1. පැවරුම් විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම, එක් එක් විෂයට අදාළ වැඩසටහන් සඳහා නිර්දේශ කිරීම.
2. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම.
3. මූල්‍ය කටයුතු, ලැබීම් සහ ගෙවීම් සම්බන්ධ නීති රීති සකස් කිරීම.
4. නිෂ්පාදන පිරිවැය සහ මිල නියම කිරීම.
5. අයවැය, වාර ගිණුම්, අවසාන ගිණුම්, ප්‍රගති සමාලෝචනය සහ ඇගයීම් සහ වාර වාර්තා ඉදිරිපත් කිරීම සකස් කිරීම.
6. විගණන විමසුම් සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) සඳහා පිළිතුරු සකස් කිරීම.
7. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ කටයුතු කිරීම.
8. යහපත් නිෂ්පාදන පුරුදු ක්‍රියාත්මක කිරීමට අධීක්ෂණය සහ සහාය වීම සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ තත්ත්ව කළමනාකරණ පද්ධතියට අනුගත වීම.

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ පළමු උපාධියක් .

හෝ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක/ආයතනයක ගිණුම්කරණ සහ මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම්.

සහ

(ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක / ආයතනයක ගිණුම්කරණය සහ මූල්‍ය/ව්‍යාපාර පරිපාලනය / වාණිජ්‍යය / කළමනාකරණය යන ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි (Masters) සුදුසුකම්.

හෝ

(ii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ICASL)/ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ (CIMA)/ සහතික කළ සහ ආයතනික ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) ආයතනික සාමාජිකත්වය.

හෝ

(iii) පිළිගත් වෘත්තීය ආයතනයක ගිණුම්කරණ සහ මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ ආශ්‍රිත සාමාජිකත්වය.

සහ

(ඇ) රාජ්‍ය / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක මූල්‍ය හෝ විගණන ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM 1-1) අවම වශයෙන් වසර 12 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

**සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයින්**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කළමණාකාර මට්ටමේ ( MM 1-1) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර දෙකක (02) සතුටුදායක අඛණ්ඩ සේවය

වැටුප් පරිමාණය : HM 1-1 - රු. [80,295 – 15 x 2,270 = 114,345]

වයස : අවුරුදු 35ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55ට වැඩි නොවිය යුතුය.
අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

බඳවාගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**අනෙකුත් ප්‍රතිලාභ**

- සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන නිල වාහනයක් හෝ අංක PED 1/2015 (i) චක්‍රලේඛය ප්‍රකාරව තමන්ගේ වාහනය සඳහා දීනාවක්
- ඉන්ධන දීමනාව (මාසිකව ඩීසල් හෝ පෙට්‍රල් ලීටර් 120ක්)

## (02) ඖෂධ තාක්ෂණඥ -නිෂ්පාදන (JM 1-1 – II ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ඖෂධවේදී, ස්වභාවික විද්‍යාව හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පළමු උපාධිය හෝ සමාන සුදුසුකම්.

සහ

ආ)පරිගණක සාක්ෂරතාවය.

සහ

ඇ) සුදුසුකම් ලැබීමෙන් පසු ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද.

**සුදුසුකම්** : **අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1.ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වූ සුදුසුකම් ලබා තිබීම.

2.තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ''කළමනාකරණ සහකාර -තාක්ෂණික'' (MA 2-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක් (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම

- වැටුප් පරිමාණය : JM 1-1 රු. [42,600 – 10 x 755 - 18 x 1135= 70,580]
- වයස් සීමාව : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වඩා නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.
- බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

## (03) තත්ත්ව සහතික නිලධාරී - (JM-1-1 - II ශ්‍රේණිය)

**සුදුසුකම්** : **අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1.විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් රසායන විද්‍යාව හෝ ඖෂධවේදය විෂය ඇතුළුව විද්‍යාව පිළිබඳ උපාධියක්.

2.තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද අදාළ විෂය ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

සහ

රාජ්‍ය/සංස්ථා/මණ්ඩලයක් හෝ පිළිගත් වෙළඳ ආයතනයක ඖෂධ තත්ත්ව සහතික ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද.

**සටහන:** ඖෂධ රසායනාගාර කටයුතු සහ තත්ත්ව කළමනාකරණය පද්ධති පිළිබඳ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සුදුසුකම්** : **අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර -තාක්ෂණික" (MA 2-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක් (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

- වැටුප් පරිමාණය : JM 1-1 රු. [42,600 – 10 x 755 - 18 x 1135= 70,580]
- වයස් සීමාව : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වඩා නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.
- බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

## (04) ක්ෂුද්‍රජීවවේදි (JM 1-1 – II ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ වෙනත් උපාධියක්.

**සටහන :** ක්ෂුද්‍රජීව විද්‍යාගාර පරීක්ෂණවල පළපුරුද්ද ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සුදුසුකම්** : **අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර -තාක්ෂණික" (MA 2-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක් (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

- වැටුප් පරිමාණය : JM 1-1 රු. [42,600 – 10 x 755 - 18 x 1135= 70,580]
- වයස් සීමාව : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වඩා නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.
- බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

## (05) රසායනඥ - (JM 1-1 – II ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන රසායන විද්‍යාව හෝ ඖෂධවේදය විෂය ඇතුළුව විද්‍යාව පිළිබඳ උපාධියක්.

සටහන: විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව පිළිබඳ පසුබිම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර -තාක්ෂණික" (MA 2-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක් (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

- වැටුප් පරිමාණය : JM 1-1 රු. [42,600 – 10 x 755 - 18 x 1135= 70,580]

- වයස් සීමාව : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වඩා නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

## (06) ප්‍රවාහන නිලධාරි - (JM 1-1 – II ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක යාන්ත්‍රික/මෝටර් රථ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය.

හෝ

ආ) තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට (NVQ 7) සමාන යාන්ත්‍රික / මෝටර් රථ ඉංජිනේරු පාඨමාලාව.

හෝ

ඇ) තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට (NVQ 6) සමාන යාන්ත්‍රික / මෝටර් රථ ඉංජිනේරු පාඨමාලාව.

සහ

රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක මෝටර් රථ ප්‍රවාහන වාහන ඇණිය කළමනාකරණය කිරීමේ තාක්ෂණික හා පරිපාලන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද.

හෝ

ඇ) තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ 5) සමාන යාන්ත්‍රික / මෝටර් රථ ඉංජිනේරු පාඨමාලාව.

සහ

රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක මෝටර් රථ ප්‍රවාහන වාහන ඇණිය නඩත්තු කිරීම පිළිබඳ තාක්ෂණික හා පරිපාලන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහයක (10) පශ්චාත් සුදුසුකම් ලැබීමේ පළපුරුද්ද සහ කළමනාකරණය කරන මෝටර් රථ ප්‍රවාහන වාහන ඇණිය භාරව අවම වශයෙන් වසර පහක අධීක්ෂණ ධාරිතාවක් තිබීම.

සහ

ඉ) පරිගණක සාක්ෂරතාවය
**සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර -තාක්ෂණික" (MA 2-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක් (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

- වැටුප් පරිමාණය : JM 1-1 රු. [42,600 – 10 x 755 - 18 x 1135= 70,580]
- වයස් සීමාව : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වඩා නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.
- බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

## (07) තාක්ෂණික සහකාර - වට්ටෝරු, පර්යේෂණ සහ සංවර්ධන (MA -2-1 – III ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් [පහත (අ) ,(ආ) හෝ (ඇ) ]**

(අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

(ආ) (i) අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව සම්මාන 04ක් සමඟ විෂයයන් 06ක් සමත් වීම.

සහ

(ii) අ.පො.ස (උ.පෙළ) විභාගයේදී රසායන විද්‍යාව (සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව සම්මාන 2ක් සමඟ තනතුරට අදාළ විද්‍යා හෝ තාක්ෂණික විෂයයන් තුනක් (03) සමත් වීම.

සහ

(iii) මාස හයකට නොඅඩු පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

සහ

(iv) පිළිගත් රසායනාගාරයක අවම වශයෙන් අවුරුදු දෙකක (2) විශ්ලේෂණ පළපුරුද්ද.

(ඇ) පුහුණුවන්නන් බඳවා ගැනීම

ඉහත (ආ) (i), (ii) සහ (iii) සුදුසුකම් සහිත අයවලුන් පුහුණුවන්නන් ලෙස බඳවා ගැනීම

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පුහුණුවන තාක්ෂණික සහකාරවරයෙකු ලෙස වසර 1 ½ ක සේවාස්ථ පුහුණු කාලය සම්පූර්ණ කිරීම සහ ලිඛිත පරීක්ෂණය සමත් වීම තාක්ෂණික සහකාර ලෙස ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීම සඳහා පූර්ව අවශ්‍යතා වේ.

**සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයින්**

ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

- වැටුප් පරිමාණය : MA 2-1 : Rs. [30,310 – 10x300 – 7x350 – 4x495 -20x660 – 50,940]
- වයස් සීමාව : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වඩා නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.
- බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

## (08) තත්ත්ව සහතික සහකාර - (MA 2-1 – III ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් [පහත (අ) ,(ආ) හෝ (ඇ) ]**

අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

ආ) (i) අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව සම්මාන 04ක් සමඟ විෂයයන් 06ක් සමත් වීම.

සහ

(ii) අ.පො.ස (උ.පෙළ) විභාගයේදී රසායන විද්‍යාව (සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව සම්මාන 2ක් සමඟ තනතුරට අදාළ විද්‍යා හෝ තාක්ෂණික විෂයයන් තුනක් (03) සමත් වීම.

සහ

(iii) මාස හයකට නොඅඩු පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

සහ

(iv) පිළිගත් ඖෂධ / ආහාර නිෂ්පාදන ආයතනයක තත්ත්ව සහතික ක්ෂේත්‍රයට අදාළ අවම වශයෙන් අවුරුදු දෙකක (2) පළපුරුද්ද.

ඇ) පුහුණුවන්නන් බඳවා ගැනීම

ඉහත (ආ) (i), (ii) සහ (iii) සුදුසුකම් සහිත අයවලුන් පුහුණුවන්නන් ලෙස බඳවා ගැනීම.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පුහුණුවන තත්ත්ව සහතික සහකාරවරයෙකු ලෙස වසර 1 ½ ක සේවාස්ථ පුහුණු කාලය සම්පූර්ණ කිරීම සහ ලිඛිත පරීක්ෂණය සමත් වීම තත්ත්ව සහතික සහකාර ලෙස ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීමට පූර්ව අවශ්‍යතා වේ.

**සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයින්**

ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

- වැටුප් පරිමාණය : MA 2-1 : Rs. [30,310 – 10x300 – 7x350 – 4x495 -20x660 – 50,940]
- වයස් සීමාව : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වඩා නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.
- බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

## (09) ඖෂධ නිමාකිරීමේ තාක්ෂණ ශිල්පී - (MA 2-1 – III ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් [පහත (අ) ,(ආ) හෝ (ඇ) ]**

අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

ආ) (i) අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව සම්මාන 04ක් සමඟ විෂයයන් 06ක් සමත් වීම.

සහ

(ii) අ.පො.ස (උ.පෙළ) විභාගයේදී (සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) තනතුරට අදාළ විද්‍යා හෝ තාක්ෂණ විෂයයන් තුනක් (03) සමත් වීම.

සහ

(iii) මාස හයකට නොඅඩු පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

සහ

(iv)පිළිගත් ඖෂධ නිෂ්පාදන ආයතනයක ක්ෂේත්‍රයට අදාළ අවම වශයෙන් වසර දෙකක (2) පළපුරුද්ද.

ඇ) පුහුණුවන්නන් බඳවා ගැනීම -

ඉහත (ආ) (i), (ii) සහ (iii) සුදුසුකම් සහිත අයවලුන් පුහුණුවන්නන් ලෙස බඳවා ගැනීම.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පුහුණුවන ඖෂධ නිමාකිරීමේ තාක්ෂණ ශිල්පී ලෙස වසර 1 ½ ක සේවාස්ථ පුහුණු කාලය සම්පූර්ණ කිරීම සහ ලිඛිත පරීක්ෂණය සමත් වීම ඖෂධ නිමාකිරීමේ තාක්ෂණ ශිල්පියෙකු ලෙස ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීමට පූර්ව අවශ්‍යතා වේ.

**සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයින්**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

2. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සේවකයෙකු වශයෙන් ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ පුහුණු කාණ්ඩයේ, අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි ඇතුළු විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් සමත් වීම හා අදාළ පළපුරුද්ද ලබා ගැනීම සඳහා ස්ථිර තනතුරක වසර 05ක තෘප්තිමත් අඛණ්ඩ සේවයක් සහිතව සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පුහුණුවන ඖෂධ නිමාකිරීමේ තාක්ෂණ ශිල්පියෙකු ලෙස වසර 1 ½ ක සේවාස්ථ පුහුණු කාලය සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

- වැටුප් පරිමාණය : MA 2-1 : Rs. [30,310 – 10x300 – 7x350 – 4x495 -20x660 – 50,940]
- වයස් සීමාව : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වඩා නොවැඩි විය යුතුය.
  අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.
- බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

**ආන්තික ප්‍රතිලාභ:**

• පැමිණීම සහ කාර්ය සාධන දිරිගැන්වීම.

- උපයෝගී කර නොගත් වාර්ෂික සහ අසනීප නිවාඩු මුදල් ගෙවීම.
- වෛද්‍ය රක්ෂණ ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිපූරණ යෝජනා ක්‍රමය ලබා දීම.
- සංස්ථාව විසින් වැටුපෙන් 15%ක් හා සේවකයා 10%ක් වශයෙන් සේවක අර්ථසාධක අරමුදලට දායක විය යුතුය.
- සංස්ථාව විසින් වැටුපෙන් 3%ක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක වීම.
- 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛයට අනුව පාරිතෝෂිකය ගෙවනු ලැබේ.
- වෙනත් ආන්තික ප්‍රතිලාභ.

**පොදු උපදෙස්:**

- නියමිත ආකෘති පත්‍ර වල සකසන ලද අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ විමසුම් විස්තර සමඟ ඉදිරිපත් කළ යුතුය. සියලුම අධ්‍යාපන සහතිකවල සහතික කළ පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා තිබිය යුතුය. අදාළ අයදුම් පත්‍රය ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන https://www.spmc.gov.lk වෙතින් බාගත කර ගත හැකිය.
- රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් හරහා යොමු කළ යුතු අතර, ඔවුන් තෝරාගනු ලැබුවහොත්, පත්වීම ලබා ගැනීම සඳහා අයදුම්කරු නිදහස් කළ හැකිද යන්න සහතික කළ යුතුය.
- ඉල්ලුම් කරන තනතුර අයදුම්පත බහාලු ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු අතර, අයදුම්පත් මෙම දැන්වීම පළ වී දින 10ක් ඇතුළත පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති**
**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**
**අංක 11, සර් ජෝන් කොතලාවල මාවත**
**කඳවල වත්ත - රත්මලාන.**